ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍ය ගරු (ආචාර්ය) ධම්මික පටබැඳි මැතිතුමාගේ ඉන්දීය සංචාරය**
**(2026 පෙබරවාරි 24-27)**

ශ්‍රී ලංකා රජයේ පරිසර අමාත්‍ය ගරු (ආචාර්ය) ධම්මික පටබැඳි මැතිතුමා නව දිල්ලියේ පැවති 25 වන ලෝක තිරසාර සංවර්ධන සමුළුවට (WSDS) සහභාගී වීම සඳහා 2026 පෙබරවාරි 24-27 දක්වා ඉන්දීය සංචාරයක නිරත විය. මෙම සමුළුව බලශක්ති සහ සම්පත් (TERI) ආයතනය විසින් ඉන්දීය රජයේ පරිසර, වන සහ දේශගුණික විපර්යාස අමාත්‍යාංශය හා එක්ව සංවිධානය කර තිබිණ. සමුළුවේ තේමාව වූයේ 'පරිවර්තන: තිරසාර සංවර්ධනය සඳහා දැක්ම, හඬවල් සහ වටිනාකම්' යන්නයි.

2. ගරු අමාත්‍යතුමා 2026 පෙබරවාරි 25 වන දින සමුළුවේ සමාරම්භක සැසියට සහභාගී වූ අතර 2026 පෙබරවාරි 26 වන දින 'අපේක්ෂාව සහ බලපෑම සඳහා බලවේගයක් ලෙස බහුපාර්ශ්වීයත්වය' යන තේමාව යටතේ පැවති අමාත්‍යවරුන්ගේ විශේෂ සැසිය සඳහා සහභාගී විය.

3. සමුළුවට සමගාමීව ගරු අමාත්‍යතුමා පරිසර, වන සහ දේශගුණික විපර්යාස යන ක්ෂේත්‍රවල ප්‍රමුඛ පෙළේ ඉන්දීය පාර්ශ්වකරුවන් සමඟ වටමේස සාකච්ඡාවකට ද සහභාගී විය. ඉන්දියානු කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මෙම වටමේස සාකච්ඡාවේදී ප්‍රතිපත්තිමය රාමු, තාක්ෂණික සහයෝගිතාවය සහ පාරිසරික තිරසාරභාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් අදහස් හුවමාරු කරගැනීමට අවස්ථාව හිමි විය.

4. ගරු අමාත්‍යතුමා ගුරුග්‍රාම් හි පිහිටි බලශක්ති සහ සම්පත් ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සංචාරයක ද නිරත විය. මෙම සංචාරය අතරතුර දී බලශක්ති සහ සම්පත් ආයතනයේ ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, ක්ෂුද්‍ර ප්‍රචාරණ තාක්ෂණ උද්‍යානය, පැසවුම් තාක්ෂණ පර්යේෂණ මධ්‍යස්ථානය සහ වෙනත් නව්‍ය තාක්ෂණික මූලපිරීම් සම්බන්ධයෙන් දැනුම සහ අවබෝධය ලබා දෙන ලදී.

5. මෙම සංචාරය පාරිසරික, දේශපාලන විපර්යාස අවම කිරීම, තිරසාර සංවර්ධනය සහ හරිත තාක්ෂණය යන ක්ෂේත්‍රයන් තුළ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ද්විපාර්ශ්වික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කළේය.

****

**කොළඹ**

***2026* මාර්තු *01***